# 多言語情報コーナー　　　　　　　　（令和５年　６月号）

## 1. තොචිගි ප්‍රාන්තයේ 150 වැනි සංවත්සරය පිලිබඳව

1873 ජූනි 15 වන දින, එවකට පැවති තොචිගි ප්‍රාන්තය සහ උත්සුනොමියා ප්‍රාන්තය ඒකාබද්ධ වී දැනට පවතින තොචිගි ප්‍රාන්තය ආරම්භ විය.

මෙසේ ආරම්භ වූ තොචිගි ප්‍රාන්තයේ 150 වැනි සංවත්සරය මෙම වසරේ සමරනු ලැබේ.
1884 දී, තොචිගි ප්‍රාන්ත ප්‍රධාන කාර්යාලය උත්සුනොමියා වෙත ගෙන යාමට පෙර වසර 11 ක් ප්‍රාන්ත ප්‍රධාන කාර්යාලය පිහිටා තිබුණේ තොචිගි නගරයේ ය.

තොචිගි යන ප්‍රාන්ත නාමය පළමු ප්‍රාන්ත ප්‍රධාන රාජ්‍ය කාර්යාලය තොචිගි නගරය තුල පිහිටීම හේතුවෙන් සඳහන් කරනු ලැබේ.

වර්තමාන තොචිගි සංස්කෘතික මධ්‍යස්ථානය , කලා කෞතුකාගාරය, තොචිගි ප්‍රධාන ප්‍රාථමික පාසල සහ තොචිගි උසස් පාසල යන ආයතන තිබෙන ප්‍රදේශය තුල තොචිගි ප්‍රධාන නගර කාර්යාලය පිහිටා තිබුණි.
තොචිගි ප්‍රාන්තයේ 150 වැනි සැමරුම් උත්සවය ජුනි 10 වැනි සෙනසුරාදා දින පෙ.ව. 9.30 සිට පස්වරු 3.00 දක්වා, තොචිගි නගරයේ කලා කෞතුකාගාරය ඉදිරිපිට ඇති විවෘත භූමිය තුල එදෝ කාලයේ පැවති රූප ප්‍රතිමා ප්‍රදර්ශනයක් පැවැත් වේ.

එසේම, රාත්‍රී 7:00 සිට රාත්‍රී 10:00 දක්වා, තොචිගි ප්‍රධාන ප්‍රථමික පාසල් උද්‍යානයේ උණුසුම් වායු බැලූන පියාසර කිරීම අත්විඳිය හැකිය. කෙසේ වෙතත්, බැලූනයක් තුලට ඇතුල් වීමට නම්, නගරයේ වෙබ් අඩවියෙන් කල්තියා වෙන් කරවා ගැනීම අවශ්‍ය වේ.

සියලුම විදේශීය පදිංචිකරුවන් පැරණි තොචිගි නගරයේ ඉතිහාසය ගැන ඔබට ඉගෙන ගත හැකි අතර වර්තමාන තොචිගි නගරය සංකේතවත් වන ඇඳුම් මගින් සංකේතවත් වීම ඉතා සතුටු දායක වේ.

## 2. කසළ නිසි ලෙස වර්ග කිරීම පිලිබඳව

අප්‍රේල් 05 වෙනිදා ඉවාෆුනේ ප්‍රදේශයේ නොදැවෙන කැළිකසළ වන සිදුරු නොකරන ලද ස්ප්‍රේ කෑන් සහ කුඩා ප්‍රමාණයේ ගෑස් ටින් එකතුකර ප්‍රවාහනය කරන කසල රථය ගිනිගැනිමකට ලක්වී ඇති අතර එයට එයට හේතුව ලෙස ස්ප්‍රේ කෑන් සහ ගෑස් ටින් බව අනුමාන කෙරේ.

මෑත වසරවලදී තොවිගි පිරිසිදු කිරීමේ ආයතනයේ තොරතුරු වලට අනුව වසරකට ගිනිගැනීම් 100 ක් පමණ වාර්තා වේ.මීට ප්‍රධාන හේතුව ලෙස නොදැවෙන කැලිකසල සමග දමන ලද කුඩා ප්‍රමාණයේ බැටරි හෝ ස්ප්‍රේ කෑන් බවට සැලකේ.

එවැනි ගිනි ගැනීම් ඇතිවීම මගින් කසළ එකතු කරන වාහන සහ කසළ බැහැර කිරීමේ සේවා පවත්වාගෙන යාමට නොහැකි වනු ඇත.තවද මෙම කසල එකතු කිරීමේ සහ කසල බැහැර කිරීමේ සේවාව සිදුකරන අය අනතුරු වලට ලක්වීමේ අවදානමක්ද පවතී.

ස්ප්‍රේ කෑන් සහ කුඩා ප්‍රමාණයේ ගෑස් ටින් සම්පූර්ණයෙන්ම පාවිච්චි කිරීමෙන් පසු පැහැදිලිව පෙනෙනසේ ස්ථාන දෙකක් සිදුරු කර එම සිදුරු කරනු ලැබූ ස්ථාන පැහැදිලිව පෙනෙනසේ පැනකින් රවුම් කර විනිවිද පෙනෙන බෑගයක දමා නොදැවෙන කැලිකසල සමග වන වෙනම කසල බැහැර කිරීම සිදුකල යුතුය.

කුඩා ප්‍රමාණයේ විදුලි උපකරණ වල ඇති බැටරි ඉවත් කර එය ක්‍රියා විරහිත කර කරුණාකර කුඩා ප්‍රමාණයේ විදුලි උපකරණ කසළ බැහැර කිරීමේ දිනයට කසල බැහැර කිරීම සිදුකල යුතුය.

අපි ඔබගෙන් ඉල්ලා සිටින්නේ කසල බැහැර කිරීමේ නීති රීති පිළිපදින ලෙසත් ඔබේ කසළ නිසි ලෙස බැහැර කරන ලෙසත්ය.

### 3. තොචිගි අජිසයි උත්සවය පිලිබදව

ජූනි 16 සිට ජූලි 2 දක්වා ඕහිරා කන්ද තුල ඇති ප්‍රාන්ත ස්වභාවික උද්‍යාන කඳුබෑවුම තුල තොචිගි අජිසයි උත්සවය පැවැත් වේ.

ඕහිරා කන්ද තුල ඇති දේවස්ථානය වෙත යන මාර්ගයේ ඇති ගල් පඩි 1,000 ක පමණ දෙපස, 2,500 ක් පමණ විවිධ පාට වලින් මල් පිපී ඇත.

තොචිගි නගරයේ මල ලෙස අජිසයි මල නම් කර ඇත. බොහෝ නගරවාසීන්ට ඕහිරා කන්දේ ඇති අජිසයි මල් පිළිබඳ අවබෝධයක් ඇති අතර ඉදිරියට එන වර්ෂා කාලය තුල පාසැල් තුල හා උද්‍යාන තුල මෙම අජිසයි මල් දැකිය හැකිය.

වැස්සට තෙමුණු අජිසයි මල් වඩාත් ලස්සන වන අතර මෙම කාලය තුල දැකිය හැකි මල් නැරබීම ඔබගේ මනස සැහැල්ලු නොවේද .